# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2361/46 - 2023 දෙසැම්බර් මස 08 වැනි සිකුරාදා - **2023.12.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : MOR/LAN/01/FI/206.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/4/2017/D/124.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ විදුලි යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපල ස්ථානගත ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලක්ෂපතිය (මොරටුව මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද 2022.08.15 දිනැති කැඩැස්තර සිතියම් අංක 520210 කලාප 20න් 10 වැනි කලාපයේ පත්‍ර අංක 2 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 3.3897ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් වේ:

01. කැබලි අංක **307**
ඉඩමේ නම: කුට්ටේරියාවලවත්ත, වෙලෝනාවත්ත; හිමිකම් කියන අය: ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය; ප්‍රමාණය : හෙක්ටයාර් 3.3531.

02. කැබලි අංක **308**
ඉඩමේ නම: කුට්ටේරියාවලවත්ත, වෙලෝනාවත්ත; හිමිකම් කියන අය: ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0366.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 පෙබරවාරි මස 27 වැනි දින පෙ.ව. 10.00ට මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 පෙබරවාරි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඉෂංකා ඩී. කේ. උඩවත්ත,**
ප්‍රාදේශීය ලේකම්,
මොරටුව.

2023 දෙසැම්බර් මස 04 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0109

1A - G 040961 – 24 (2023/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*